# 2

# සිරිලක පැවිදි වූ සියම් රජ කුමරු : ප්‍රිස්දාන් චුම්සායි*

ජ්.ඩබ්ලිව්.ඒ. හසිත චාමිකර ගුණසිංහ

**සංක්ෂිප්තය**

ලක්දිවට පැමිණ පැවිදි බිමට පිවිසි විදෙස් රාජකීයයන් පිළිබඳ තොරතුරු අනුරාධපුර යුගයේ පමණ පටන් සාහිත්‍ය මූලාශ්‍රයයේ දැකගත හැකි ය. මින් මෙරට දී පැවිදි බිමට පත්ව විහාරාධිපති තනතුරක් ද හොබවමින් ශාසනික වශයෙන් වැදගත් මෙහෙවරක් ඉටු කරන ලද රාජකීයයකු පිළිබඳ තොරතුරු හමුවන්නේ සියම් රජ කුමරකු වූ ප්‍රිස්දාන් චුම්සායි සම්බන්ධව පමණි. සියම් රජුගේ සමීප ඥාතියකු මෙන්ම සියම් රජ පෙළපතේ පූර්වගාමී රජකුගෙන් පැවත ආ මෙම කුමරු විදෙස් රටක අධ්‍යාපනය ලබා උපාධියක් ලත් පළමු සියම් ජාතිකයා ද වේ. පසු කලෙක ජිනවරවංස නමින් පැවිදි බිමට පත් එකුමරු කොටහේන දීපදුත්තාරාමාධිපති හිමියන් වශයෙන් ද කටයුතු කරන ලදී. ජිනවරවංස හිමියන් විසින් සම්පාදිත ලේඛන හා වෙනත් සාහිත්‍ය මූලාශ්‍රය ආශ්‍රයෙන් උන්වහන්සේ පිළිබඳ තොරතුරු අධ්‍යයන කරන ලද අතර අන්තර්ජාලය ඇසුරෙන් උන්වහන්සේගේ ඡායාරූප එකතුවක් ද සොයාගන්නා ලදී. කපිලවස්තුපුර සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් කොටසක් මෙරටට හිමිකර ගැනීම, කොටහේන දීපදුත්තාරාමය සංවර්ධනය කිරීම, බෞද්ධ අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය නඟා සිටුවීමට කටයුතු කිරීම ආදී වැදගත් කාර්යය රැසක් ජිනවරවංස හිමියන් අතින් සිදුව තිබේ. කොටහේන දීපදුත්තරාමයේ ඉදිකර තිබෙන රතන චෛතිය ද උන්වහන්සේගේ පුරෝගාමී මෙහෙවරකි. පසු කලෙක උපැවිදි වීමට සිදු වුව ද, ජීවිතය කාලය පුරාම පෙරළිකාර භූමිකාවක් ප්‍රිස්දාන් කුමරුන්ගෙන් සිදු වූ බව පෙනෙන්නට තිබේ.

* Please cite this article as: ගුණසිංහ, ජ්.ඩබ්ලිව්.ඒ.එච්.සී. (2020), සිරිලක පැවිදි වූ සියම් රජ කුමරු : ප්‍රිස්දාන් චුම්සායි, *The Journal of Archaeology and Heritage Studies*, Vol. 5 Issue I, Chief Editor : C.B. Ambanwala, Rajarata University of Sri Lanka, Mihintale. pp 29-49

මුඛ්‍ය පද : ප්‍රිස්දාන් චුම්සායි, සියම, දීපදුත්තාරාමය, රත්න චෛතිය, කපිලවස්තු ධාතු

## හැඳින්වීම

නූතන බෞද්ධ පුනරුදයේ පුරෝගාමියා වශයෙන් හඳුන්වන්නේ වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් වහන්සේ ය. එකල ක්‍රිස්තියානි මිෂනාරීන්ගේ සංස්කෘතික ආක්‍රමණයට පිළිතුරු වශයෙන් උන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් වාද කිහිපයක්ම පවත්වන ලද අතර ඉන් වඩාත් ප්‍රකට වූයේ වර්ෂ 1873 දී පැවැත් වූ පානදුරා වාදයයි. මෙම සෑම වාදයක දීම බුදුදහමේ සත්‍යතාව සනාථ කිරීමට ගුණානන්ද හිමියන් විසින් කටයුතු කරන ලද්දේ ක්‍රිස්තියානි පාර්ශවය දුර්මුඛ කරමිනි. මීට අමතරව ග්‍රන්ථ සම්පාදනය කරමින් හා අමුද්‍රිතව පැවති බෞද්ධ ග්‍රන්ථ මුද්‍රණය කරමින් විශිෂ්ට අන්දමේ ශාස්ත්‍රීය සේවාවක් සිදුකිරීමට ද උන්වහන්සේ මූලික වූහ. මෙම සියලු කටයුතු සිදු වූයේ උන්වහන්සේ වැඩසිටි කොටහේනේ පිහිටි 'දීපදුත්තාරාමය' නම් විහාරස්ථානයේ කේන්ද්‍ර කොටගෙන ය. කොළඹ නගරයේ ඉදි වූ ප්‍රථම විහාරස්ථානය වශයෙන් සැලකෙන දීපදුත්තාරාමය වර්ෂ 1873 දී ආරම්භ වූ බව පිළිගැනේ. කොටහේනේ කුලතුංග විජේසිරිවර්ධන වලව්වේ කොටසක පවුලේ පුද්ගලික විහාරය වශයෙන් පැවති මෙය වඩාත් විධිමත් අන්දමින් ඉදිකරවනු ලැබුවේ සවියෙල් තාබ්‍රෙව් උභය කුලතුංග විජේසිරිවර්ධන මුදලිතුමා හෙවත් රටගිය මුදියන්සේගේ මූලිකත්වයෙනි. අනතුරුව සීනිගම ධීරක්ඛන්ධ හිමිපාණන් වහන්සේට පූජා කරන ලද මෙම විහාරස්ථානයේ අධිපතිත්වයට වර්ෂ 1844 දී පත් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියෝ විහාරයට 'දීපදුත්තාරාමය' යනුවෙන් නම් තබමින් වඩ වඩාත් දියුණුවට පත්කරන්නට වූහ. උන්වහන්සේගේ අපවත්වීමෙන් පසුව කෙටි කලක් වස්කඩුවේ ශ්‍රී සුභූති මහානාහිමියන්ගේ භාරකාරීත්වය යටතේ පැවති දීපදුත්තාරාමයේ විහාරාධිපතිත්වයට ඉන් අනතුරුව පත්වූයේ සියම් රාජ කුමාර ප්‍රිස්දාන් චුම්සායි ජිනවරවංස හිමිපාණන් වහන්සේ ය (අභයසුන්දර 1994:102-107, 461-462, 466; මනතුංග 2016:77).

## ප්‍රිස්දාන් කුමරුගේ මුල් කාලීන ජීවිතය

සියම් සිහසුන ඉසිලූ තුන්වන රාම හෙවත් නංක්ලාඕ රජුගේ (1824-1851) සිවුවන පුත්‍රයා වූ ක්‍රොම් ඛුන් රාජ්සිහවික්‍රොම් කුමරු (Prince Krom Khun Rajsihavikrom) සහ මොම් නොයි කුමරියට (Mom Noi Chumsai Na Ayudhya) දාව ප්‍රිස්දාන් චුම්සායි කුමරු උපත ලද්දේ වර්ෂ 1851 පෙබරවාරි මස 23 වනදා ය. පසුව සියම් සිහසුන ඉසිලූ සතරවන රාම හෙවත් මොංකුට් රජුගේ (1851-1868) ඥාති මුනුපුරකු වූ ප්‍රිස්දාන් කුමරු, පස්වන රාම හෙවත් චූලාලංකාර රජුගේ (1868-1910) ඥාති පුත්‍රයකු ද විය (Jinavaravansa & Jumsai, 2003:213; 'The Life and Time of Prince Prisdang', http://www.geocities. ws/RainForest/Vines/8769/Prisdang.htm; Prince Prisdang in

Thai, https://th.wikipedia.org/wiki/ พระวรวงศ์เธอ พระองค์เจ้าปฤษฎางค์; Jumsai, 2004:107).

මොංකුට් රජුගේ මෙන්ම චූලාලංකාර රජුගේ ද අනුග්‍රහය ඇතිව විශ්වවිද්‍යාල මට්ටම දක්වා සිය අධ්‍යාපනය ලබාගැනීමේ හැකියාව ප්‍රිස්දාන් කුමරුට හිමිවූයේ රජ පවුලේ සාමාජිකයකු වීම හේතුවෙනි. ඒ යටතේ සිංගප්පූරුවේදී මූලික අධ්‍යාපන ලබාගත් කුමරු වර්ෂ 1871 දී උසස් අධ්‍යාපන කටයුතු සඳහා මහා බ්‍රිතාන්‍යයට පිටත් විය. එහිදී ඉංජිනේරු ශාස්ත්‍රය පිළිබඳ උපාධියක් වර්ෂ 1876 දී ඔහු හිමිකරගත්තේ එංගලන්තයේ ප්‍රකට උසස් අධ්‍යාපන ආයතනයක් වූ King’s College මගිනි (ඡායාරූපය 1). එම වර්ෂයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී කුමරු ත්‍යාග රාශියක් හිමිකරගන්නේ එවකට බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය විලියම් ග්ලැඩ්ස්ටෝන් මහතාගේ විශේෂ පැසසුමක් සහිතව ය. මේ පිළිබඳ වර්ෂ 1876 ජූලි මස 7 වනදා පළ වූ The Times පුවත්පතෙන් ද ප්‍රචාරයක් ලබා දී තිබිණි (Jinavaravansa & Jumsai, 2003:213). බටහිර විශ්වවිද්‍යාලයකින් උපාධියක් හිමිකරගත් ප්‍රථම සියම් ජාතිකයා වීමේ ගෞරවය ද මෙනිසා කුමරුට හිමිවිය (Hecker, & Bhikkhu Nyanatusita, 2008:200).



ඡායාරූපය 1 : ප්‍රිස්දාන් කුමරු උපාධිය ලබාගත් දා http://www.geocities.ws/RainForest/Vines/8769/Prisdang.htm

පෙරලා සිය රටට පැමිණි ප්‍රිස්දාන් කුමරු නැවත වරක් මහා බ්‍රිතාන්‍යයට පිටත්ව යන්නේ බ්‍රිතාන්‍ය ඉංජිනේරු සමාගම් කිහිපයක සේවයකොට වෘත්තීය අත්දැකීම් ලබාගැනීමේ අපේක්ෂාවෙනි. ඒ යටතේ ඕලන්දයේ Zuiderzee නම් වේලි ව්‍යාපෘතියට ද කුමරු සම්බන්ධව සිටි බව සඳහන් වේ (‘The Life and Time of Prince Prisdang’, http://www.geocities.ws/RainForest/Vines/8769/Prisdang. htm; Jumsai, 2004:108). වර්ෂ 1879 දී සියම වෙනුවෙන් රාජ තාන්ත්‍රික සේවය සඳහා ප්‍රිස්දාන් කුමරු තෝරාගනු ලැබූ අතර මහා බ්‍රිතාන්‍යය වෙනුවෙන් පළමු වරට පත්කරන ලද සියම් තානාපති ධූරය වර්ෂ 1880 දී ඔහුට හිමිවිය. ඒ යටතේ වර්ෂ 1881 දී සිය අක්ත පත්‍රය වික්ටෝරියා රැජිණට පිළිගන්වමින් සිය රාජකාරි අරඹන ලද කුමරුට, වසර පහක් වැනි කෙටි කාලයක් තුළ යුරෝපා රටවල් 11ක් සහ ඇමරිකා එක්සත් ජනපදය වෙනුවෙන් පත්කරන ලද සියම් තානාපතිවරයා වශයෙන් භාරධූර වගකීමක් ඉටුකිරීමට සිදුවිය (Jinavaravansa & Jumsai, 2003:213; Jumsai, 2004:108) (ඡායාරූපය 2).



ඡායාරූපය 2 : ප්‍රිස්දාන් කුමරු යුරෝපයේ සහ ඇමරිකාවේ සියම් තානාපතිවරයා ලෙස
Jumsai, 2004:114

සියම් තානාපතිවරයා වශයෙන් විදෙස් රටවල සහයෝගය තම රටේ දියුණුව උදෙසා යොදාගැනීම පිළිබඳ ප්‍රිස්දාන් කුමරුගේ අවධානය නිරතුරුව යොමුව තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1855 දී බ්‍රිතාන්‍ය රජය සමග ඇතිකරගෙන තිබූ එකඟතාවය සංශෝධනකොට සියම තුළ තැපැල් හා විදුලි පණිවුඩ සේවාව ස්ථාපනය කිරීමට සහ සියම සඳහා විශ්ව තැපැල් සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමේ පුරෝගාමී මෙහෙවර ඉටුකරන ලද්දේ ප්‍රිස්දාන් කුමරුන් විසිනි. ඒ වෙනුවෙන් වර්ෂ 1884 දී ලිස්බන් හා වර්ෂ 1885 දී බර්ලින්වල පැවති විශ්ව තැපැල් සංගමයේ මහ සමුළු සඳහා ද කුමරු සහභාගි විය. එපමණක් නොව සියම වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රදර්ශනවල (Universal Exposition) අවස්ථාවක් ලබාගැනීමට ද කුමරු විසින් ප්‍රයත්න දරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1900 දී පැරීසියේ පැවති ජාත්‍යන්තර ප්‍රදර්ශනයෙන් (Exposition Universelle) සියම වෙනුවෙන් වෙන්කළ කොටසක් ලබාගැනීමට හැකිවිය (Jinavaravansa & Jumsai, 2003:213; Prince Prisdang Chumasai, http://de. wikipedia.org/ wiki/Prisdang; Jumsai, 2004:113). මෙම කාලසීමාවේ දී සියම් රජු විසින් චූල චොම් ක්ලාඕස් (Royal Order of Chula Chom Klaos) නම් සිවුවන ශ්‍රේණියේ රාජකීය ගෞරව පදවියට ප්‍රිස්දාන් කුමරුව පත්කරන ලද්දේ ඔහුගේ සේවය අගය කරමිනි (Jumsai, 2004:115) (ඡායාරූපය 3).



ඡායාරූපය 3 : චූල චොම් ක්ලාඕස් නම් රාජකීය ගෞරව පදවියට ප්‍රිස්දාන් කුමරුව පත් කිරීම
Jumsai, 2004:115

මේ වන විට මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ බෞද්ධ පුනර්ජීවන වැඩපිළිවෙල පිළිබඳ විදෙස් රටවල පවා ප්‍රචාරය වෙමින් පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහා බ්‍රිතාන්‍යය බලා පිටත්වන අතරවාරයක වර්ෂ 1886 දී ප්‍රිස්දාන් කුමරු මෙරටට පැමිණෙන්නේ ගුණානන්ද හිමියන්ව ද හමුවීමේ අපේක්ෂාව ඇතිව ය. කොටහේන දීපදුත්තාරාමයට කුමරු පැමිණි අවස්ථාවේදී දෙස් විදෙස්හි ශාස්ත්‍රඥයකු වශයෙන් ප්‍රකටව සිටි වස්කඩුවේ සුභූති නාහිමිපාණන් වහන්සේ හඳුනාගැනීමට ද කුමරුට හැකිවිය. උන්වහන්සේ හා කුමරු අතර පැවති පිළිසඳර කෙතෙක් වීද යත් තමාට විවේකයක් ලැබුණු අවස්ථාවක ලංකාවට පැමිණ උන්වහන්සේ සමීපයේ පැවිදි වන බව කුමරු ප්‍රකාශ කළ බව කියැවේ (අභයසුන්දර 1994:385).

මෙම කාලසීමාවේ දී යුරෝපා රටවල් සඳහා පත්කළ සියම් තානාපතිවරයා වශයෙන් නව යටත් විජිත ඇතිකිරීමේ කාර්යයේ නියැලී සිටි යුරෝපා රටවලින් සියම මුදා ගැනීම සඳහා සියම් දේශයේ සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රිස්දාන් කුමරුගේ අවධානය යොමුව තිබිණි. ඒ යටතේ වර්ෂ 1885 දී පළමු වරට සියම් දේශය වෙනුවෙන් ව්‍යවස්ථාවක් කෙටුම්පත්කොට ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් ඇතිකිරීම සඳහා යෝජනාවලියක් ප්‍රිස්දාන් කුමරු විසින් සම්පාදනය කරන ලදී. සියම් කුමාරුවරුන් කිහිප දෙනෙක්ම ඒ සඳහා එකඟත්වය පළ කරමින් අත්සන් තබා තිබිණි. එහෙත් එවන් පුළුල් ප්‍රතිසංස්කරණයක් සිදුකිරීමේ අපේක්ෂාවක් සියම් රජුට නොවූ හෙයින් එම ව්‍යවස්ථා කෙටුම්පත හෝ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් වූ බවක් නොපෙනේ. ඒ වන විටත් එම ව්‍යවස්ථා කෙටුම්පත හා යෝජනාවලිය ප්‍රසිද්ධියට පත්ව තිබීම හා එමගින් බහු විවාහ ක්‍රමයට එරෙහි වීම වැනි කරුණු කෙරෙහි සියම් රජුගේ ප්‍රසාදයක් නොතිබූ බව ද කියැවේ (Hecker & Bhikkhu Nyanatusita, 2008:200). මෙනිසා වර්ෂ 1886 දී තානාපති සේවයෙන් ඉවත්ව වහාම සියමට පැමිණිය යුතු බවට ප්‍රිස්දාන් කුමරුට නියම කෙරිණි. ආපසු සිය රටට පැමිණි කුමරුව පරිපාලන කටයුතු සඳහා සම්බන්ධ කරන ලද අතර ඒ යටතේ තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඔහුව පත්කෙරිණි (ඡායාරූපය 4). සියම තුළ තැපැල් හා විදුලි පණිවුඩ සේවාව ස්ථාපනය වීම තමාගේ



ඡායාරූපය 4 : තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස http://www.piprahwa.com/original-photos/

මූලිකත්වයෙන් සිදු වූ කටයුත්තක් වූ හෙයින් වඩාත් සක්‍රීයව ඒ සඳහා සම්බන්ධවීමේ අවස්ථාව නව තනතුරත් සමග කුමරුට උදාවිය (Jinavaravansa & Jumsai 2003:213).

සියමේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් ඇතිකරගැනීමේ අභිලාෂයෙන් සිටි කුමරුට වර්ෂ වර්ෂ 1890 දී චූලාලංකාර රජු බලයෙන් පහකර සිහසුන අත්කර ගැනීමේ උත්සහයක් පිළිබඳ රාජද්‍රෝහී චෝදනාවක් එල්ල විය. එය ප්‍රතික්ෂේප කළ කුමරු සියමෙන් පිටත්වන්නට තීරණය කරන්නේ අර්බුදකාරී තත්ත්වය සමනය කිරීමේ අපේක්ෂාවෙනි (Jinavaravansa & Jumsai, 2003:213-214; Hecker & Bhikkhu Nyanatusita, 2008:27). සියමෙන් පිටත් වූ කුමරු කලක් ඉන්දියාවේ ගත කළ බව කියැවේ (Jumsai 2004:113).


## ප්‍රිස්දාන් කුමරුගේ පැවිදිවීම

ප්‍රිස්දාන් කුමරු සිය පැවිදිවීමේ බලාපොරොත්තුව සපුරා ගැනීම සඳහා වර්ෂ 1896 දී ලංකාවට පැමිණෙන අතර ඒ වන විට මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් අපවත් වී වසර හයක් ගතව තිබිණි. එවකට අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ මහානායක පවර නේරුත්තිකාචාරිය මහා විහාවි වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමියන්ගේ ආචාර්යත්වයෙන් එම වර්ෂයේ නොවැම්බර් 5 වනදා වස්කඩුවේ අභිනවාරාමයේදී ප්‍රිස්දාන් කුමරු පැවිදි බිමට පිවිසෙන්නේ 'ජිනවරවංස' නාමයෙනි (Jinavaravansa & Jumsai 2003:214). ලේඛනවල අත්සන් තැබීමේ දී පී.සී. ජිනවරවංස නමින් උන්වහන්සේ භාවිත කළ හෙයින් සම්පූර්ණ පැවිදි නාමය වූයේ ප්‍රිස්දාන් චුම්සායි ජිනවරවංස වූ බව පෙනේ (ඡායාරූපය 6). මේ හැරෙන්නට 'සියම් කුමාර




ඡායාරූපය 5 : වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමියන් සහ ජිනවරවංස හිමියන් Jinavaravansa & Jumsai, 2003:233

හාමුදුරුවෝ' යන අපර නාමයක් ද උන්වහන්සේට භාවිත විය. සියම් රාජකීයයකු තමන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි




ඡායාරූපය 6 : ජිනවරවංස හිමියන්ගේ අත්සන
http://www.piprahwa.com/original-photos/

කළ හෙයින් එතැන් පටන් වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමියන්ට ද 'රාජගුරු' යන ගරු නාමය භාවිත වූ බව කියැ වේ (ඡායාරූපය 5).

සියම් රාජ කුමාරුවරුන්ට අදාළ සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසුණු ප්‍රිස්දාන් කුමරු පැවිදි පින්කම සඳහා සහභාගි වූ තමාගේ සියලු ආභරණ, පදක්කම්, හිස් වැසුම සහිත නිල ඇඳුම තුනුරුවනට පූජා කරන ලද බව කියැවේ. එහි වටිනාකම රන් පවුම් තුන් දහසක් පමණ වෙතැයි කියනු ලැබේ. මීට අමතරව කුමරුගේ මුඩු කරන ලද හිස කෙස්, හැඳ සිටි සිල් රෙදි ආදිය ඇතුළු සියලු දෑ ආවරණවල අසුරා වර්තමානය දක්වාම වස්කඩුවේ ශ්‍රී සුභූති විහාරයේ තැන්පත් කර තිබේ (අභයසුන්දර, 1994:463-464).

**කපිලවස්තු සර්වඥ ධාතු මෙරටට ලබාගැනීම**

පසුව එම වර්ෂයේ දී ජිනවරවංස හිමියන් ඉන්දියාවේ පූජනීය ස්ථානය වැඳපුදා ගැනීමේ අපේක්ෂාවෙන් එහි වැඩම කරවන ලදී (ඡායාරූපය 7). ලුම්බිණි, බුද්ධගයා, බරණැස හා කුසිනාරා යන පුණ්‍ය භූමි වන්දනා කරන ලද උන්වහන්සේට ලුම්බිණියේ දී අසල වතුයායක හිමිකරුට නටබුන්ව පැවති ස්තූපයක් කොටස් හමු වූ පුවත සැලවිණි (Jinavaravansa & Jumsai 2003:214).




ඡායාරූපය 7 : ජිනවරවංස හිමියන් ඉන්දිය සංචාරය අතරතුර දී
http://www.piprahwa.com/original-photos/

ඉංග්‍රීසි ජාතික ඉංජිනේරුවරයකු වූ විලියම් ක්ලැක්ස්ටන් පෙප්පේ (W.C. Peppè) බ්‍රිද්පූර් ප්‍රදේශයේ වතු යායක් මිලට ගෙන එහි වගා කටයුතු සිදුකරවමින් සිටි අතර ඔහුගේ අවධානය යොමුවූයේ වතුයායේ විශේෂ ලක්ෂණවලින් යුතු කඳුගැටයක් පිළිබඳව ය. වර්ෂ 1897 දී ඔහු විසින් එම කඳුගැටයේ කැණීම් කටයුතු ආරම්භ කරන ලද අතර එය ස්තූපයක් බව හඳුනාගැණුනු හෙයින් 'පිප්‍රාවා

ස්තූපය' නමින් නම් කෙරිණි. කැණීම් අතරවාරයේ දී ස්තූපයේ අභ්‍යන්තරයේ විශාල ප්‍රමාණයේ ශෛලමය මංජුසාවක තිබී කුඩා ධාතු කරඬු කිහිපයක් සොයාගැනීමට පෙප්පේ මහතාට හැකිවිය. එම ධාතු කරඬුවල කොටා තිබූ අක්ෂර කියවීමේ කටයුතු සඳහා වින්සන්ට් ආතර් ස්මිත්, වස්කඩුවේ ශ්‍රී සුභූති මහානාහිමියන් ඇතුලු විද්වත් පිරිසකගේ දායකත්වය හිමි වූ අතර එමගින් තහවුරු වූයේ මෙම කරඬුවල අන්තර්ගත වන්නේ බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා බවයි. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් දිනකට පසුව පැවති ආදාහන පූජෝත්සවයෙන් අනතුරුව ද්‍රෝණ බමුණාගේ මැදිහත්වීමෙන් සර්වඥ ධාතූන් වහන්සේලා රාජ්‍ය අටකට බෙදනු ලැබූ අතර ඉන් බුදුන්ගේ ඥාති ශාක්‍යයන්ට හිමි වූ කොටස තැන්පත් කරන ලද්දේ මෙම ස්තූපය අභ්‍යන්තරයෙහි බව ද හඳුනාගැනිණි ('The Discovery', http://www.piprahwa.com/the-discovery/).

මේ පිළිබඳ සැලවීමත් සමග පෙප්පේ සමග ලිපි සංවාදයක් සිදුකරන ලද ජිනවරවංස හිමියෝ (ඡායාරූපය 8), ධාතු කරඬු සොයාගැනීමෙන් සතියකට පමණ පසු බ්‍රිද්පූර් වතුයායට වැඩම කළහ. උන්වහන්සේගේ අපේක්ෂාව වූයේ පිප්‍රාවා ස්තූපයෙන් හමු වූ සර්වඥ ධාතූන් වහන්සේලා ලංකාවාසී බෞද්ධයන්ට සහ ඒ වන විට සිටි ලොව සිටි එකම බෞද්ධ රජු වූ සියමේ චූලාලංකාර රජු වෙත ලබාගැනීමයි. වස්කඩුවේ ශ්‍රී සුභූති මහානාහිමියන් සහ පෙප්පේ අතර ද මේ පිළිබඳ සාකච්ඡා කරමින් ලිපි ගනුදෙනු කිහිපයක් ද සිදුවිණි. එහෙත් පෙප්පේ ගේ අදහස වූයේ සර්වඥ ධාතූන් වහන්සේලාගේ හිමිකාරීත්වය පිළිබඳ අවසන් තීරණය ගත යුත්තේ රජයේ බලධාරීන් බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවකට ඉන්දියාවේ ප්‍රතිරාජ එල්ගින් සාමිවරයා සමග පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව පිප්‍රාවා ස්තූපයෙන් හමු වූ සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් හා ආභරණවලින් කොටසක් සියමේ චූලාලංකාර රජුට ද, තවත් කොටස් කිහිපයක් ලංකාව, ජපානය, බුරුමය හා රුසියාවේ බෞද්ධ ජනතාවට ද ලබාදීමට ජිනවරවංස හිමියෝ සමත් වූහ. ඉතිරි සර්වඥ ධාතූන් වහන්සේලා ඒවා තැන්පත්ව තිබූ කරඬු ද සමග වර්තමානයේ දී ද නව දිල්ලි ජාතික කෞතුකාගාරයේදී දැකගත හැකිය. සියම් රජුට හිමි වූ සර්වඥ ධාතූන්


Buddhagaya
3rd Sept. 1898
My dear Mr. Peppe
About a fortnight ago I sent you an album of a complete collection of Siamese postage & Revenue stamps which contains all the stamps as are in Siam even in the present day except one one att stamp which has since been introduced. Several of these are now not issued and are therefore very rare. I hope you have received it all right.
Yours very truly
H. Jinawarawansa

ඡායාරූපය 8 : ජිනවරවංස හිමියන් විසින් පෙප්පේ මහතාට යවන ලද ලිපියක්
http://www.piprahwa.com/theletters/

වහන්සේලා තැන්පත්කොට බැංකොක් නුවර ස්වර්ණ පර්වත මස්තකයේ Wat Saket විහාරස්ථානයේ ස්තූපයක් කරවන ලදී. ලංකාවට හිමි වූ සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් කොටසක් වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමියන්ට ද, ජිනවරවංස හිමියන්ට ද, මහනුවර හා අනුරාධපුර විහාරස්ථාන කිහිපයකට ද හිමිවිය. සුභූති මාහිමියන්ට ලැබුණු සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් කොටසක් අද දක්වාම වස්කඩුවේ ශ්‍රී සුභූති විහාරයේදී වන්දනාමාන කිරීමේ අවස්ථාව හිමිකර දී තිබේ (Jinavaravansa & Jumsai, 2003:214; 'After the Discovery', http://piprahwa.com/after-the-discovery). ජිනවරවංස හිමියන් සතුව පැවති සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කොට කරවන ලද ස්තූපය පිළිබඳ ඉදිරියේ දී දැක් වේ.



ඡායාරූපය 9 : චුල්ල ලංකා දූපතේ බවුන් වඩන ජිනවරවංස හිමියන්
Jinavaravansa & Jumsai, 2003:236

**ජිනවරවංස හිමියන් මෙරට සිදුකරන ලද ශාසනික මෙහෙවර**

වර්ෂ 1897 දී සියම් මහතෙරුන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් ලාංකික භික්ෂූන් වහන්සේලා සඳහා උපසම්පදා මංගල්‍යයක් ලංකාවේ පවත්වන ලද්දේ ජිනවරවංස හිමියන් විසින් සියම් සංඝරාජ හිමියන්ගෙන් සිදුකරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙනි (Jinavaravansa & Jumsai 2003:214). ඒ සඳහා සියම් රජුගේ අනුග්‍රහය ඇතිව සියමේ ධම්මයුත්තික මහානිකායේ මහතෙරුන් වහන්සේලා වැඩකරවන ලදී (අභයසුන්දර 1994:464). ජිනවරවංස හිමියන්ගේ උපසම්පදාව ද මේ සමග සිදුවන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

වර්ෂ 1900 දී ආරණ්‍යවාසී දිවියක් ගත කිරීමේ අපේක්ෂාව පෙරදැරි කරගත් ජිනවරවංස හිමියන් ඒ සඳහා මාතර නගරයට ආසන්න ගල්ගොඩියාන ප්‍රදේශයේ කුඩා දූපතක් තෝරාගන්නා ලදී (ඡායාරූපය 9). ප්‍රදේශවාසීන් විසින් විසකුරු සර්පයන්

මුදාහැරීමට තෝරාගෙන තිබූ මෙම දූපතේ මිනිස් ඇටකැබලි පවා තැන්පත්ව තිබිණි. ඒ සියල්ල මධ්‍යයේ උන්වහන්සේ පහසුවෙන් මෙහි වැඩසිටි බව කියැ වේ (Jinavaravansa & Jumsai 2003:214). ජිනවරවංස හිමියන් විසින් මෙම දූපත 'චූල ලංකා/චුල්ල ලංකා' යනුවෙන් හඳුන්වන ලද්දේ එවකට සියම් රජු වූ චූලාලංකාර රජුට ගෞරව පිණිස මෙන්ම කුඩා ලංකාව යන අරුත ද ඇතිව ය (Hecker & Bhikkhu Nyanatusita 2008:27, 201; Jinavaravansa & Jumsai 2003:214). පසුව ඒ ප්‍රදේශයේ දායකයන් විසින් එම දූපත උන්වහන්සේට පූජා කරන ලද බව කියැවේ (අභයසුන්දර 1994:464).

ජිනවරවංස හිමියන් සමග මෙම දූපතේ වැඩ වාසය කිරීමට එක් වූ තවත් භික්ෂූන් වහන්සේ නමක වූයේ ජර්මන් ජාතික ඤාණාතිලෝක හිමියන් ය. බටහිර රටවල බුදුදහම ව්‍යාප්ත කිරීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කරන ලද්දේ උන්වහන්සේ විසිනි. ජිනවරවංස හිමියන් සමග චුල්ල ලංකා දූපතේ ගත කළ කාලසීමාව පිළිබඳ ඤාණාතිලෝක හිමියන්ගේ චරිතාපදානයේ තොරතුරු රැසක් අන්තර්ගත වේ. එහි දැක්වෙන අන්දමට පොල් අතු සෙවිලි කළ මඩුවල උන්වහන්සේලා වාසය කළ අතර විවිධ පිරිස් උන්වහන්සේලා බැහැදැකීමට පැමිණ තිබේ. ඒ අතර සිටි ඕලන්ද හා ජර්මන් තරුණයන් දෙදෙනෙක් පසුව ඤාණාතිලෝක හිමියන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි වූයේ සුඤ්ඤ හා සුමන යන නම්වලිනි. උන්වහන්සේලා ද වැඩ වාසය කරන ලද්දේ මෙම දූපතේම ය (Hecker & Bhikkhu Nyanatusita 2008:27-28) මෙම කාලසීමාවේ ජිනවරවංස හිමියන්ගේ පැවිදි දිවිය පිළිබඳ දැනගත් ලංකාණ්ඩුකාර ශ්‍රීමත් හෙන්රි බ්ලේක් සහ ඊඩිත් බ්ලේක් ආර්යාව සමග ද මෙම දූපතට පැමිණි බව කියැවේ (අභයසුන්දර 1994:464-465).

**ජිනවරවංස හිමියන් දීපදුත්තාරාමාධිපති ධුරයට පත්වීම**

බටහිර ලෝකය සමග සබඳතා රැසක් තිබූ ජිනවරවංස හිමියන් හුදෙකලා දූපතක වැඩවාසය කිරීම වෙනුවට අගනුවර පිහිටි දීපදුත්තාරමයේ වැඩ සිටින්නේ වඩාත් පුළුල් ශාසනික මෙහෙවරක් උන්වහන්සේට සිදුකළ හැකි හෙයින් දෝ වර්ෂ 1900 දී කොටහේනේ දීපදුත්තාරාමයට වැඩම කරවන ලෙස වස්කඩුවේ ශ්‍රී සුභූති මාහිමිපාණන් වහන්සේ විසින් ජිනවරවංස හිමියන්ගෙන් ඉල්ලා සිටින ලදී (අභයසුන්දර 1994:464).

දීපදුත්තාරාමාධිපතිව වැඩ විසූ වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් අපවත්වන විට උන්වහන්සේගේ පැවිදි ශිෂ්‍යයන් වූ මිගෙට්ටුවත්තේ ජනානන්ද සහ මිගෙට්ටුවත්තේ ඉන්දසෝම යන හිමිවරුන් බාල වියේ පසු වූ හෙයින් කොටහේනේ දීපදුත්තාරාමයේ විහාරාධිපතිත්වය පවරන ලද්දේ ශ්‍රී සුභූති

මාහිමිපාණන් වහන්සේ වෙතට ය. උන්වහන්සේ වස්කඩුවේ අභිනවාරාමයේ වැඩ වාසය කළ හෙයින් දීපදුත්තාරාමයේ කටයුතු බොහොමයක් සිදුකරන ලද්දේ මිගෙට්ටුවත්තේ ජනානන්ද හිමියන් විසිනි. තමන් වහන්සේගේ ආචාර්යවරයා මෙන්ම වාදීභසිංහයකු වූ ජනානන්ද හිමියන් විසින් වර්ෂ 1899 දී ඔරුගොඩවත්තේ වාදය පවත්වමින් ක්‍රිස්තියානි පාර්ශවය දුර්මුඛ කරමින් බෞද්ධ පාර්ශවයට ජය අත්කරදෙන ලදී. හදිසි අනතුරක් හේතුවෙන් උන්වහන්සේ අකාලයේ අපවත් වූ අතර එය බෞද්ධ විරෝධී කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බවට එකල මත පැතිරිණි (අභයසුන්දර 1994:461-463).




ඡායාරූපය 10 : ජිනවරවංස හිමියෝ
http://www.piprahwa.com/original-photos/

ජනානන්ද හිමියන් අපවත් වීමත් සමග දීපදුත්තාරාමයේ කටයුතු පවත්වාගෙන යමින් වඩාත් පුළුල් ශාසනික මෙහෙවරක් සිදුකරගෙන යාම සඳහා ශ්‍රී සුභූති මාහිමිපාණන් වහන්සේගේ උපදෙස් පරිදි වර්ෂ 1905 දී දීපදුත්තාරාමයට වැඩම කරවීමට ජිනවරවංස හිමියන්ට සිදුවිය (ධම්මරංසි හිමි 2013). එතැන් පටන් ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස දීපදුත්තාරාමය ගොඩනැගෙන්නට වූ අතර විහාරයේ පිළිසකර කළ යුතු තැන් පිළිසකර කරවමින් නව ඉදිකරවීම් රැසක් සිදුකරවීමට උන්වහන්සේ පුරෝගාමී වූහ. ඒ යටතේ කෞතුකාගාරයක් හා පුස්තකාලයක් ඉදිකරවනු ලැබූ අතර ගුණානන්ද හිමියන් විසින් සම්පාදිත පුස්කොළ පොත් හා මුද්‍රිත ග්‍රන්ථ ආදිය එහි තැන්පත් කරන ලදී (අභයසුන්දර 1994:465).

බාලක සහ බාලිකා පාසල් දෙකක් ආරම්භ කිරීමට ද ජිනවරවංස හිමියන් කටයුතු කළ අතර ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට පවා එහි කටයුතු සම්පාදනය වී තිබිණි. මින් එක් පාසලක් වර්ෂ 1930 දී කුමාර විද්‍යාලය නමින් නම් කිරීමට ජිනවරවංස හිමියන්ගේ ශිෂ්‍ය මාදම්පිටියේ ජිනානන්ද මහනාහිමියන් විසින් කටයුතු කරන ලදී (අභයසුන්දර, 1994:465). නව ලෝකය සඳහා ගැලපෙන අධ්‍යාපනය කිසිදු පක්ෂග්‍රාහීත්වයකින් තොරව ලාංකික බෞද්ධයන් වෙත ලබාදීමේ අරමුණින් ආරම්භ

කරන ලද මෙම විද්‍යාල ක්‍රම ක්‍රමයෙන් දියුණුවට පත්විය (Jinavaravansa. & Jumsai 2003:214-215). වර්ෂ 1904 දෙසැම්බර් මස 15 වනදා ජිනවරවංස හිමියන් විසින් 'කොටහේනේ නිදහස් පාඨශාලාව' නමින් දීපදුත්තාරාම භූමියේදී පාසලක් ආරම්භ කරන ලද අතර එය විවෘත කිරීම සඳහා සහභාගි වූයේ එවකට ලංකාණ්ඩුකාර ශ්‍රීමත් හෙන්රි බ්ලේක් සහ එම ආර්යාවයි. ඉංග්‍රීසි හා ස්වභාෂා, කර්මාන්ත හා කෘෂිකර්මාන්ත අභ්‍යාස මධ්‍යස්ථානයක් වශයෙන් මෙම පාසල ක්‍රියාත්මක විය (අභයසුන්දර 1994:466).



ඡායාරූපය 11 : රත්න චෛතියේ සැලැස්ම
http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html


සියම් තානාපතිවරයකු වශයෙන් කටයුතු කළ කාලසීමාවේදී විදෙස් මිතුරන් රැසක් ඇතිකරගෙන සිටි හෙයින් ඔවුන් ජිනවරවංස හිමියන් හමුවීම සඳහා දීපදුත්තාරාමයට පැමිණීම සිරිතක් කොට ගත් බව කියැවේ. ඒ යටතේ එවකට ජර්මනියේ ඔටුන්න හිමි කුමරු සහ කුමරිය දීපදුත්තාරාමයට පැමිණීම විශේෂයෙන් සඳහන් කළ හැකිය (අභයසුන්දර 1994:465-466).

දීපදුත්තාරාමය කේන්ද්‍ර කොටගෙන ජිනවරවංස හිමියන් විසින් සිදුකරන ලද ශාසනික මෙහෙවර අගය කරමින් උන්වහන්සේ දීපදුත්තාරාමයේ විහාරාධිපති ධුරයට පත්කරන ලද අතර වර්ෂ වර්ෂ 1906 පෙබරවාරි මස 23 වනදා දීපදුත්තාරාමයට රැස් වූ අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ සුධර්මා කාරක සංඝ සභාව මගින් කොළඹ දිසාවේ සංඝනායක ධුරය ද පිරිනමන ලදී (අභයසුන්දර 1994:466).

### රත්න චෛතිය ඉදිකරවීම ආරම්භ කිරීම

දීපදුත්තාරාමයේ ඒ වන විට අඩුවක්ව පැවති ස්තූපයක් නිර්මාණය කිරීමේ කාර්යය පිළිබඳ ජිනවරවංස හිමියන්ගේ අවධානය යොමුව තිබූ අතර ඒ සඳහා මූලික කටයුතු සම්පාදනය කරමින් පැවතිණි. සියම් රජුගේ ප්‍රධානත්වයෙන් වර්ෂ 1907 දී එම ස්තූපය ඉදිකිරීමේ කටයුතු සඳහා මුල්ගල් තැබීමට උන්වහන්සේ අපේක්ෂා කළ ද එය සිදුකරගැනීමට නොහැකි විය. මේ අතරවාරයේ වර්ෂ 1908 මාර්තු මාසයේදී මලයාසියේ පිනෑං නගරයේ සිට මෙරට වන්දනාවේ පැමිණි එල්.එල්. චීක් මහත්මිය (L.L. Cheak) විසින් ජිනවරවංස හිමියන්ගේ ස්තූප කර්මාන්තය පිළිබඳ තොරතුරු දැනගැනීමෙන් පසුව එහි කටයුතු ආරම්භ කිරීම සඳහා රු. 5,000ක මුදලක් පරිත්‍යාග කරන ලදී. ස්තූපයේ මූලික කටයුතු ආරම්භ කිරීමට එම මුදල ප්‍රමාණවත් වූයෙන් ජිනවරවංස හිමියන් විසින් එම වර්ෂයේම මාර්තු 20 වන දා ස්තූපය ඉදිකරවීම සඳහා

මුල්ගල් තැබීම සිදුකරන ලද්දේ චීක් මහත්මියගේ ප්‍රධානත්වයෙනි (Jinavaravansa. & Jumsai 2003:217-218).



ඡායාරූපය 12 : රත්න චෛතියේ තැන්පත් කරන ලද ප්‍රිස්දාන් කුමරුගේ ආභරණ හා පදක්කම්
http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html

මූලික ඉදිකිරීම් කටයුතු නිමාවට පත්වීමෙන් පසුව රත්න චෛතියේ ප්‍රථම සර්වඥ ධාතු නිධානෝත්ස්වය අභාවප්‍රාප්ත බණ්ඩාරනායක වාසල මුදලිතුමාගේ ආර්යාවගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලද අතර එතුමිය පූජා කරන ලද ඇත්දත් මංජුසාවක වඩා හිඳුවන ලද සර්වඥ ධාතුන් වහන්සේලා ධාතු ගර්භයේ තැන්පත් කරන ලදී. එම සර්වඥ ධාතුන් වහන්සේලා අතර ජිනවරවංස හිමියන්ට ප්‍රිපාවා ස්තූපයෙන් හිමි වූ සර්වඥ ධාතුන් වහන්සේලා සහ අභාවප්‍රාප්ත සැම්සන් රාජපක්ෂ වාසල මුදලිවරයාගේ ආර්යාව විසින් පූජා කරන ලද සර්වඥ ධාතුන් වහන්සේලා දෙනමක් ද වූහ (Jinavaravansa & Jumsai 2003:218-219). මීට අමතරව ලංකාවේ වැඩ සිටි සර්වඥ ධාතුන් වහන්සේලා කිහිප නමක් ද, සර්වඥ පාත්‍රා ධාතුවේ කොටසක් සහ ජිනවරවංස හිමියන්ට ගිහි කල හිමිව තිබූ ආභරණ, පදක්කම් හා වටිනා ත්‍යාග කිහිපයක් ද රත්න චෛතියේ නිධන් කරන ලද බව සඳහන් වේ (අභයසුන්දර 1994:467) (ඡායාරූපය 12). රත්න චෛතියේ කටයුතු සඳහා මුල් අවස්ථාවේ පටන් උපකාර කළ මලයාසියාවේ චීක් මහත්මිය සහ එතුමියගේ ඥාතීන් විසින් ද රන් පිළිම කිහිපයක් හා ආභරණ, මැණික් ද ධාතු ගර්භයේ තැන්පත් කිරීම සඳහා පූජා කරන ලදී (Jinavaravansa & Jumsai 2003:219).

මෙම ස්තූප කර්මාන්තයේ විශේෂත්වය වූයේ එය ජිනවරවංස හිමියන්ගේ සැලැස්මකට නිර්මාණය වීමයි (ඡායාරූපය 11). උන්වහන්සේගේ පියා දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියකු සහ චිත්‍ර ශිල්පියකු වූයෙන් උන්වහන්සේට ද එහි ආභාසය ලැබී තිබුණු බව මෙමගින් පැහැදිලි වේ. ඉන්දියාවේ බුද්ධගයා සෑයේ අනුකෘතියකට අනුව කරන ලද රත්න චෛතිය අඩි 45ක් උසැති සත් මහල් ස්තූපයකි. පොළොවෙන් මතුවන පිපුණු නෙලුමක් නිරූපිත පාදමට පළමු මහල වෙන් වූ අතර ඒ මැදින් මතුවන සතරැස් කොටුව සහිත බුද්ධගයා සෑයේ ආකෘතියට දෙ වන මහල වෙන්විය. හතරැස් කොටුවේ සිට ඉහළට නැගෙන අටපට්ටම් කොටුව තට්ටු අටකින් සමන්විත වූ අතර එය තුන්වන මහලයි. අටපට්ටම් කොටුව මත සංඛ්‍යාකාර ධාතු ගර්භයක් නිම වූ අතර එය සිවුවන මහලයි. පස්වන මහල ශ්වේත ඡත්‍රයට වෙන් වූ අතර රන් මුතු මැණික් ආදියෙන් නිර්මිත එය එක පිට නැගුණු තට්ටු නවයක් සහිත එකකි. ඡත්‍රය මත වූ කොත අග බෙරලියන්තු හා වෙනත් වටිනා මැණික්වලින් නිර්මිත මල් පොකුර සයවන මහලයි. මීට අමතරව ප්‍රධාන ස්තූපය කේන්ද්‍ර කොටගෙන ප්‍රාසාද හතරක් නිම වූ අතර ඒවායේ රාජ, දිව්‍ය, බ්‍රහ්ම හා බෝධිසත්ව විමාන ලෙස නිර්මාණය කරන ලදී. දෙව් බඹුන්ගේ පිළිරූවලට අමතරව බුදු සිරිතේ විවිධ අවස්ථා ද රත්න චෛතියේ නිරූපණය කර ඇති අතර බුරුම රටින් ගෙන්වන ලද ස්වර්ණාලේප හා තීන්තවලින් ඒවා සිත්තම් කරනු ලැබූ බව සඳහන් වේ (අභයසුන්දර 1994:466-467; Jumsai 2004:107).

රත්න චෛතිය ඉදිකරවීමේ කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා අත්පොතක් වර්ෂ 1910 ඔක්තෝබර් මාසයේදී ජිනවරවංස හිමියන් විසින් ප්‍රකාශයට පත්කරන ලද්දේ ඒ පිළිබඳ ලංකාවාසී, ලෝකවාසී බෞද්ධ ජනතාව දැනුවත් කිරීමේ අරමුණ ඇතිව ය. රත්න චෛතිය ඉදිකිරීමේ අරමුණු, එහි ව්‍යුහය, ප්‍රමාණ ආදිය පිළිබඳ තොරතුරු ඇතුළත් එම කෘතිය මගින් ස්වකීය ව්‍යාපෘතිය පිළිබඳ වැඩි මහජන අවධානයක් යොමුකරවා ගැනීමට ජිනවරවංස හිමියන්ට හැකි වූ බව පෙනේ. එම කෘතියේ සෝදුපත් බැලීම සහ අන්තර්ගතය සකසා ගැනීම උන්වහන්සේට සහය වූයේ ගාල්ල මහින්ද විද්‍යාලයේ විදුහල්පති එෆ්.එල්. වුඩ්වර්ඩ් බව සඳහන් වේ (Jinavaravansa & Jumsai 2003:213, 231-232). රත්න චෛතිය හේතුවෙන් ඒ වන විට දීපදුත්තාරාමය කෙතරම් ජනප්‍රියව පැවතියේ ද යත් 'රත්න චෛතියාරාමය' නමින් අපර නමක් ද එයට භාවිත වූ බවට සාධක හමු වේ (Papers on Inter-Racial Problesm 1911: xxvi).

**ජිනවරවංස හිමියන් තායිලන්තයට වැඩම කරවීම හා උපැවිදි වීම**


වර්ෂ 1911 ජුලි මස මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පවත්වන ලද වාර්ගිකත්ව පිළිබඳ පළමු වන ලෝක සමුළුව (First Universal Races Congress) සඳහා ජිනවරවංස හිමියන් වැඩම කරවන ලදී. ඒ සඳහා ලංකාවෙන් සහභාගි වූ එකම නියෝජිතයා වූ උන්වහන්සේ බව සහභාගිවූවන්ගේ නාම ලේඛනය අනුව පැහැදිලි වේ (Papers on Inter-Racial Problesm 1911: xxvi).

අනතුරුව එම වර්ෂයේම ඔක්තෝබර් මාසයේ දී උන්වහන්සේ සියමට වැඩම කරවන්නේ එවකට සියම් රජු වූ පස්වන රාම හෙවත් චූලාලංකාර රජුගේ රාජකීය අවමංගල්‍ය උත්සවයට සහභාගි වීම සඳහා . ය. එහිදී උන්වහන්සේට උපැවිදි වීම සඳහා එවකට තායි පාලනයේ බලවත් පුද්ගලයකුව සිටි දම්රොං කුමරු විසින් බල කෙරෙන අතර එයට හේතුවන්නට ඇත්තේ ජිනවරවංස හිමියන් පැවිදිව සිටීම රජයේ කටයුතුවලට බාධාවක් වනු ඇතැයි විශ්වාස කිරීම බව පෙනේ. එපමණක් නොව ජිනවරවංස හිමියන්ට සියම් චාරිත්‍ර අනුව පැවිදි වීමට පවා එවකට සියම් සංඝරාජ වජිරඥාණ හිමියන්ගෙන් අවසර නොලැබෙන අතර උන්වහන්සේට නැවත ලංකාවට පැමිණීමට පවා අවසරයක් අභිනව සියම් රජුගෙන් නොලැබුණු බව කියැ වේ (Hecker & Bhikkhu Nyanatusita 2008:201).




ඡායාරූපය 13 : උපැවිදි කරවන ලද ප්‍රිස්දාන් කුමරු
http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html

නැවත උන්වහන්සේ මෙරටට වැඩම නොකළ හෙයින් දීපදුත්තාරාමයේ කටයුතු පවත්වාගෙන යාම භාරවූයේ උන් වහන්සේගේ පැවිදි ශිෂ්‍ය මාදම්පිටියේ ජිනානන්ද හිමියන්ට ය. වර්ෂ 1902 දී ජිනවරවංස හිමියන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි වූ ජිනානන්ද හිමියන් පෙර අපරදිග භාෂා පිළිබඳ දක්ෂයකු වූ අතර දිගින් දිගටම සියම් රාජකීයයන් සමග සබඳතා පවත්වමින් දීපදුත්තාරාමයේ සංවර්ධනයට ඔවුන්ගේ සහය ලබාගැනීමට සමත් වූ බව කියැවේ. ඒ යටතේ ජිනවරවංස හිමියන් විසින් ආරම්භ කරන ලද රත්න චෛතියේ කටයුතු නිමා කරමින් කොත් පැළඳවීම ජිනානන්ද හිමියන්ගේ විසින් සිදුකරන ලද්දේ වර්ෂ 1925 දී ය. ජිනවරවංස හිමියන් විසින් ආරම්භ කරන ලද ශාසනික සමාජීය මෙහෙවර ජිනානන්ද හිමියන් විසින් ද අඛණ්ඩව සිදුකරනු ලැබූ අතර අමරපුර සිරි සද්ධම්මවංස මහානිකායේ මහානායක ධූරයට ද වර්ෂ 1959 දී උන්වහන්සේ පත්වූහ (අභයසුන්දර 1994:468).


ඡායාරූපය 14 : ඉදිකිරීම් කටයුතු නිමාවට පත්කරන ලද රත්න චෛතිය Jinavaravansa & Jumsai, 2003:234

## ප්‍රිස්දාන් කුමරුගේ අවසානය

උපැවිදි කරවන ලද ප්‍රිස්දාන් කුමරුට පළමුව චෝදනා එල්ල කෙරුණේ රජුගේ අවසරයක් නොමැතිව රාජ සේවය අත්හැර පැවිදිවීම සම්බන්ධවයි. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය සමථයට පත්වීමෙන් පසුව සියම් විදේශ කටයුතු අමාත්‍යාංශයේ පරිවර්තකයකු ලෙස කුමරුව සේවයේ යොදවන ලදී (Jumsai 2004:113). අනතුරුව කලක් නම් Siam Observer සඟරාවේ සංස්කාරකවරයකු ලෙස කුමරු කටයුතු කළ ද කෙටි කලකින්ම සේවයෙන් පහ කරන ලද බව කියැවේ. මේ කාලසීමාවේදී ප්‍රිස්දාන් කුමරු එවකට සියම් රජු වූ සයවන රාම හෙවත් වජ්‍රායුද්ගේ (1910-1926) සොයුරකු වූ රපී කුමරු (Raphi Phatthanasak) සමග විශාල හිතවත්කමක් ගොඩනඟා ගත් අතර එය වර්ෂ 1920 රපී කුමරුගේ අභාවය තෙක් පැවතිණි. නවීන ලෝකය සමග සියම් දේශය ගමන් කළ යුතු ආකාරය පිළිබඳ අදහස් පැවති ඒ කුමරු නූතන තායි නීති පද්ධතියේ පියා වශයෙන් හැඳින් වේ ('Prince Rapee Pattanasak Father of the modern Thai legal system',http://www. jurisinterlaw.com/prince-rapee-pattanasak.html)



ඡායාරූපය 15 - ජීවිතයේ අවසන් කාලවකවානුවේදී ප්‍රිස්දාන් කුමරු
http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html

පසුව ප්‍රිස්දාන් කුමරු කලක් ජපානයේ විසූ බව කියැවෙන අතර එහිදී අලංකාර හා විශාලතම උඩු රැවුල තේරීමේ ජාත්‍යන්තර තරගයකින් ඔහුගේ උඩු රැවුලට ප්‍රථම ස්ථානයක හිමි වූ බව කියැ වේ (Jumsai 2004:116).



ඡායාරූපය 16 : ප්‍රිස්දාන් කුමරුගේ භෂ්මාවශේෂ තැන්පත් කරන ලද Wat Kharuehabodi විහාරය
https://sites.google.com/site/wadkhvhbdiwatkaruhabodee/

කුමරු පැවිදි වීමට පෙරාතුව Mom Talab Chumsai Na Ayudhya නම් කුමරියක සමග විවාහ වී සිටි බව සඳහන් වෙතත්, උපැවිදි වීමෙන් පසුව එම කුමරිය සමග ජීවත් වූ බවට තොරතුරු හමු නොවේ. අවසන් කාලසීමාවේ හුදෙකලා ජීවිතයක් ගත කළ කුමරු ස්වයං ලිඛිත චරිතාපදානය වෙළුම් තුනක් වශයෙන් සකස් කිරීමේ කටයුතුවල නියැලෙමින් සිටියේ ය. එහෙත් එය අසම්පූර්ණව තිබියදී 84 වන වියේ පසු වූ ප්‍රිස්දාන් කුමරු වර්ෂ 1935 මාර්තු 16 දී බැංකොක් නුවරදී අභාවයට පත්විය. ඔහුගේ භෂ්මාවශේෂ තැන්පත් කොට කුඩා ස්තූපයක් Wat Kharuehabodi නම් විහාරස්ථානයේ ඉදිකරවන ලදී (Jinavaravansa. & Jumsai, 2003:215-216; 'The Life and Time of Prince Prisdang', http://www.geocities.ws/RainForest/Vines/8769/Prisdang.htm; Prince Prisdang in Thai, https://th.wikipedia.org/wiki/พระวรวงศ์เธอ พระองค์เจ้าปฤษฎางค์).

වර්ෂ 1932 දී සියමේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් ස්ථාපනය කරන ලැබූ අතර මරණයට පෙර එය දැකගත හැකිවීම ප්‍රිස්දාන් කුමරු ලැබූ ජයග්‍රහණයක් වශයෙන් හැඳින්විය හැක්කේ එය තරුණ වියේ පටන් ඔහු තුළ පැවති අපේක්ෂාවක් වූ හෙයිනි (Jumsai 2004:116).



ඡායාරූපය 17 : බැංකොක් නගරයේ ඉදිකරන ලද ප්‍රිස්දාන් කුමරුගේ ප්‍රතිමාව
http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html

සියම් දේශය වෙනුවෙන් විශ්ව තැපැල් සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම සහ එහි තැපැල් සහ විදුලි පණිවුඩ සේවාව ස්ථාපනය කිරීම සඳහා ප්‍රිස්දාන් කුමරු විසින් දක්වන ලද දායකත්වය අගය කරමින් ඔහුගේ ප්‍රතිමාවක් බැංකොක් නගරයේ ස්ථාපනය කරන ලද අතර (ඡායාරූපය 17), වර්ෂ 2010 ජාතික සන්නිවේදන දිනය වෙනුවෙන් කුමරුගේ රුව ඇතුළත් සමරු මුද්දරයක් නිකුත් කිරීමට ද සියම් (තායිලන්ත) රජය විසින් කටයුතු කරන ලදී (ඡායාරූපය 18).




ඡායාරූපය 18 : ප්‍රිස්දාන් කුමරු වෙනුවෙන් නිකුත් කළ සමරු මුද්දරය
https://www.postemart.com/historypage.php?HISTORY_ID=907

**සමාලෝචනය**

ලක්දිව පැවිදි වූ විදෙස් රාජකීයයන් අතුරෙන් විශේෂ මෙහෙවරක් ඉටු කරන ලද භික්ෂුවක වශයෙන් සියම් ජාතික ජිනවරවංස හිමියන් හඳුනාගත හැකිය. එවකට සියම් රජුගේ සමීප ඥාතියකු මෙන්ම සියම් සිහසුන දරන ලද රජකුගෙන් පැවත ආ උන්වහන්සේගේ ගිහි කළ ප්‍රිස්දාන් චුම්සායි නමින් හඳුන්වන ලදී.

පළමුවරට විදෙස් අධ්‍යාපනය ලබා උපාධියක් හිමිකරගත් සියම් ජාතිකයා වීමේ භාග්‍යය හිමිකරගත් ප්‍රිස්දාන් කුමරු සියම වෙනුවෙන් රාජදූතයකු ලෙස වැදගත් මෙහෙවරක් සිදුකිරීමට සමත්විය. නූතන ලෝකය සමග සියම සම්බන්ධ කරලීමේ කාර්යයේ පුරෝගාමී මෙහෙවරක් ද කුමරු ඉටු කළ අතර තැපැල් හා විදුලි සන්දේශ කටයුතු සියමේ ව්‍යාප්ත කිරීමට ද හෙතෙම මුල් වූ බව සඳහන් වේ. එහෙත් සියම් රජු සමග ඇති වූ මතභේද මත පැවිදි බිමට පත් ප්‍රිස්දාන් කුමරු පැවිද්දකු වශයෙන් සුවිශේෂී භූමිකාවක් ද ඉටුකළ බව පෙනේ. කපිලවස්තුපුර සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් කොටසක් බෞද්ධ ලෝකයා වෙත දායාද කරලීමේලා මූලික වූ උන්වහන්සේ පසුව තමන්වහන්සේට හිමි වූ සර්වඥ ධාතු තැන්පත් කොට රතන චෛතිය නමින් විශේෂ ස්තූපයක් ද ඉදිකරවන ලදී. කොටහේන දීපදුත්තරාමය කේන්ද්‍ර කොටගෙන බෞද්ධ අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් විද්‍යාල ආරම්භ කිරීම ද ජිනවරවංස හිමියන් කටයුතු කරන ලද අතර දීපදුත්තාරාමට එකල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් ද පැවැති බව පෙනේ.

එවකට සියම් රජුගේ අභාවය හේතුවෙන් සියමට වැඩම කළ උන්වහන්සේට නැවත මෙරටට පැමිණීමට අවසර නොලැබුණු අතර උපැවිදි වීමට ද සිදුවිය. අනතුරුව ප්‍රිස්දාන් කුමරු මරණය තෙක්ම ගත කළේ සංචාරකයකු වශයෙන් හුදෙකලා ජීවිතයකි. සිය ජීවිතය පුරාම රැඩිකල් අදහස් දරන ලද ප්‍රිස්දාන් කුමරු නූතන ලෝකය සමග කටයුතු කරමින් පැවති සමාජ සම්ප්‍රදාය වෙනස් කිරීමට උත්සහ දරන ලද්දෙකු බව පෙනෙන්නට තිබේ. සිය ගිහි ජීවිතය මෙන්ම පැවිදි ජීවිතය තුළ ද ඒ තත්ත්වය පවත්වාගෙන ගිය හෙතෙම ප්‍රතිපත්තිගරුක අයකු වශයෙන් අවසානය තෙක්ම කටයුතු කිරීමට සමත් විය.

### ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


අභයසුන්දර, විමල් (1994), *මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද අපදානය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*බුද්ධවංසය-සාසනවංසය හා අමරපුරවංසය* (2011), පඤ්ඤාසීහ මහනාහිමි, මඩිහේ (සම්.), සාසන සේවක සමිතිය, සිරි වජිරඤාණ ධර්මායතනය, මහරගම.

මනතුංග, සීවලී බණ්ඩාර (2016), *පෞරාණික ස්ථාන හා ස්මාරක-කොළඹ දිස්ත්‍රික්කය*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

ධම්මරංසි හිමි, ගලගම (2013), කපිලවස්තුපුර සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය කෙරෙන කොටහේන දීපදුත්තාරාම තායි රජමහා විහාරය, *බුදුසරණ*, දෙසැම්බර් 9

Hecker, Hellmuth & Bhikkhu Nyanatusita (2008), *The Life of Nyanatiloka Thera: The Biography of a Western Buddhist Pioneer*, Buddhist Publication Society, Kandy.

Jinavaravansa, P.C. & Jumsai, Sumet (2003), The Ratna Chethiya Dìpaduttārāma, Colombo, *Journal of Royal Asiatic Society of Sri Lanka New Series*, Vol. 48, Royal Asiatic Society of Sri Lanka, Colombo.

Jumsai, Sumet (2004), Prince Prisdang and the Proposal for the First Siamese Constitution, 1885, *Journal of the Siam Society*, Vol. 92, The Siam Society, Bangkok.

*Papers on Inter-Racial Problesm* (1911), Spiller, G. (ed.), P.S. King & Son, London.

**අන්තර්ජාල මූලාශ්‍රය**

'After the Discovery', http://piprahwa.com/after-the-discovery

'Prince Prisdang', http://en.wikipedia.org/wiki/Prince_Prisdang

'Prince Prisdang', http://de.wikipedia.org/wiki/Prisdang

'Prince Prisdang' in Thai, https://th.wikipedia.org/wiki/ พระวรวงศ์เธอ พระองค์เจ้าปฤษฎางค์

'Prince Rapee Pattanasak Father of the Modern Thai Legal System', http://www.jurisinterlaw.com/prince-rapee-pattanasak.html

'The Discovery', http://www.piprahwa.com/the-discovery/

'The Life and Time of Prince Prisdang', http://www.geocities.ws/RainForest/Vines/8769/Prisdang.htm

'ชีวิตดั่งนิยาย-พระองค์เจ้าปฤษฎางค์ กระดูกสันหลังพระปิยะมหาราช', http://topicstock.pantip.com/library/topicstock/2009/07/K8075368/K8075368.html

'ตราไปรษณียากรที่ระลึกวันสื่อสารแห่งชาติ 2553', https://www.postemart.com/historypage.php?HISTORY_ID=907

'หลวงพ่อพระพุทธแซกคำ',
https://sites.google.com/site/wadkhvhbdiwatkaruhabodee/